# ඇද නෑරෙන බලු වලිගය

කපිල පීරිස් මහතා නැවතත් තමාට තහවුරු කිරීමට නොහැකි මතයක් හීන් සීරුවේ තමාගේ ඊනියා අපේ ඉංජිනේරු සම්ප්‍රදාය නමැති ලිපි පෙළෙන් කියා පෑමට උත්සාහ කරයි. මාස දෙකකටත් වැඩි කලක් තිස්සේ අපේ ප්‍රවාද ලිපි පෙළ නවතා මට කපිල පීරිස් මහතාගේ ලිපිවලට පිළිතුරු දීමට සිදු විය. ඒ ඔහුගේ ලිපිවලින් කියැවුණු කරුණු කිහිපයක් සම්බන්ධයෙනි. ඉන් ප්‍රධාන ම කරුණක් වූයේ අපේ පැරැන්නන් විසින් ඉංජිනේරු ක්‍ෂෙත්‍රය යැයි අද හැඳින්වෙන දැනුම් පද්ධතියෙහි කරන ලද නිර්මාණ නිව්ටෝනීය විද්‍යාවෙන් තේරුම් ගැනීම ය.

කපිල පීරිස් මහතා පුන පුනා කියා සිටියේ එසේ කිරීම වැදගත් බව හා අද එසේ කිරීමෙන් හැරෙන්නට ඊනියා අපේ ඉංජිනේරු සම්ප්‍රදාය තේරුම් ගැනීමට නොහැකි බව ය. ඔහුගේ ප්‍රධාන තර්කයක් වූයේ අපේ පැරණි නිර්මාණ පිළිබඳ දැනුමක් අද අප සතුව නොමැති බැවින් එසේ නිව්ටෝනීය විද්‍යාව මගින් ඒ නිර්මාණ තේරුම් ගත යුතු බව ය. මෙහි දී කිවයුතු ප්‍රධාන කරුණක් නම් කපිල පීරිස් මහතා අපේ ඉංජිනේරු සම්ප්‍රදාය යනු කුමක් දැයි පැහැදිලි නො කිරීම ය. අපේ ඉංජිනේරු සම්ප්‍රදාය යනුවෙන් ඔහු විසින් හඳුන්වනු ලැබුයේ අපේ ජීවන සම්පයදාය මිස අනෙකක් නොවන බව මම පැහැදිලි කර දුන්නෙමි.

බටහිර නිපදවන ලද බයිසිකලය ද (පා පැදිය) රේල් බසය ද ඔහු අපේ ඉංජිනේරු සම්ප්‍රදායට උදාහරණ ලෙස ගෙන දැක්වී ය. බටහිර පා පැදිය ඉන් නොනැවතුණ බව හෝ එය අද බටහිර ගමනාගමනයෙහි දී යොදාගන්නා ප්‍රධාන වාහනයක් නොවන බව හෝ ඔහු අමතක කෙළේ ය. පා පැදිය තබා යතුරු පැදියවත් අද බටහිර ප්‍රධාන ගමනාගමන මාධ්‍යයක් නො වේ. පා පැදිය නිර්මාණය වූයේ බටහිර යාන්ත්‍රික වාහනවල මුල් අවස්ථාවේ බවත් එහි තිබුණේ අපේ ජීවන සම්ප්‍රදායෙන් උකහා ගත් මූල ධර්මයක් නොවන බවත් එක්කෝ කපිල පීරිස් මහතාට අමතක විය. නැත්නම් ඔහු හිතා මතා ම ඒ බව අමතක කෙළේ ය.

අපේ ඉංජිනේරු සම්ප්‍රදායෙහි මූල ධර්ම පිළිබඳ වැටහීමක් ඇත්තකු අද නැතැයි කපිල පීරිස් මහතා කියයි. තමාට ඒ ප්‍රතිනිර්මාණය කිරීමට තරම් බුද්ධිමය හැකියාවක් නැති බව ද ඒ මහතා දනියි. එහෙත් එයින් කියැවෙන්නේ අනාගතයේ දී ඒ ප්‍රතිනිර්මාණය කිරීමට නොහැකි ඉංජිනේරුවකු මෙරටින් බිහි නොවන බව නො වේ. අපේ වෑයම එවැන්නකු හෝ එවැන්නන් හෝ යම් දිනක බිහිකර ගැනීම ය. අපේ ප්‍රවාද ලිපි පෙළ කපිල පීරිස් මහතාට නම් ප්‍රලාප විය හැකි ය. එහෙත් අප ඒ ලිපි පෙළ ලියන්නේ ඉහත කී අන්දමේ පුද්ගලයන් ද බිහිකර ගැනීමේ චේතනාවෙනි.

කපිල පීරිස් මහතාට ඒ සඳහා ඉවසීමක් නැත. ඔහු දැන් පවතින සංවර්ධනයට එරෙහිව වෙනත් සංවර්ධනයක් අද අද ම බිහිකර ගත යුතු යැයි කියයි. ඔහුගේ ඊනියා අපේ ඉංජිනේරු සම්ප්‍රදාය ලිපි පෙළ ඒ සඳහා ය. එහෙත් දැන් පවත්නා සංවර්ධන සම්පයදාය වෙනුවට වෙනත් සම්ප්‍රදායක් ඇතිකර ගැනීම අපේ ඉංජිනේරු සම්ප්‍රදාය නමින් ලියැවෙන ලිපිවල  විස්තර කෙරෙන අපේ පැරණි නිර්මාණ නිව්ටෝනීය විද්‍යාවෙන් තේරුම් ගැනීමෙන් කළ හැකි දෙයක් නො වේ. මේ බව අපි කරුණු සහිතව පුන පුනා කීවෙමු. කපිල පීරිස් මහතාට අප කී දෑට එරෙහිව ගෙන ආහැකි තර්කයක් නැත. එහෙත් ඔහු තම අදහස ඉවත් කරගෙන නැත.

ඒ බව පසුගිය 23 වැනි දා ඔහු ලියූ ලිපියෙන් පැහැදිලි වෙයි. ඔහු මෙසේ කියයි. “ අපේ පැරැන්නන් සතු වූ භූගත ජල හැසිරීම පිළිබඳ අවබෝධය කෙතරම් ද යන්න මෙමගින් පැහැදිලි ය. එසේ ම මෙහි දී වැදගත් වන්නේ මේ දැනුම තම වැඩ කටයුතු සඳහා උපරිම ලෙස ස්වාභාවිකත්වය තුළ ම හිඳිමින් ජල චක්‍ර නො බිඳිමින් ප්‍රයෝජනයට ගත් ආකාරයයි. අද අප මේ ජල ක්‍රියාවන් නූතන ජල ගති (නිව්ටෝනීය) විද්‍යා මගින් තේරුම් ගත්ත ද, ඔවුන් මේවා කරගෙන ඇත්තේ සොබාදහම පිළිබඳ වෙන ම වූ වැටහීමකිනි.

එම වැටහීම අද අපට නැත. ඒ නිසා අද අපි මේවා නූතන විද්‍යා මගින් තේරුම් ගනිමු. අතීත ඉංජිනේරු (සංවර්ධන) සම්ප්‍රදායට නැවත එසවීමට එය පවතින තත්ත්වයන් තුළ බාධාවක් නො වේ. මේ භූගත ජක ආවරණ පිළිබඳ නූතන ද්‍රව යාන්ත්‍රික විග්‍රහයක් රූපය 1 හි ඇත.”

© Prof. Nalin De Silva

පුරා දෙමසකට වැඩි කාලයක් පැවති විවාදයෙහි දී (කපිල පීරිස් මහතා තම කුහක ප්‍රතිපත්තියට අනුව විවාද නොකරන්නේ යැයි කියමින් විවා ද කෙළේ ය. තර්ක නොකරන්නේ යැයි කියමින් තර්ක කෙළේ ය) කපිල පීරිස් මහතාට මේ සම්බන්ධයෙන් අප නැගූ තර්කවලට පිළිතුරු නොමැති විය. ඔහු ඒ ගැන අදහස් ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටියේ ය. විවාදයක දී තමන්ට තර්ක නැතිනම් ඇතැම්හු ප්‍රතිවාදියාගේ මතය පිළිගනිති. එහෙත් බොහෝ දෙනා එසේ නොකරන බව අපි දනිමු. තර්කයෙන් පැරදීමෙන් පසුව වුව ද ඔවුහු ප්‍රතිවාදී මතය නො පිළිගෙන තම මතයේ ම එල්ලී සිටිති.

කපිල පීරිස් මහතා ද ඒ ගණයට අයත් වෙයි. කපිල පීරිස් මහතාගේ නවතම දාර්ශනික හඳුනාගැනීම වූ ද ඔහුගේ මිතුරකු වූ ද උදයසිරි වික්‍රමරත්න මහතාට අනුව මා නිර්මාණාත්මක සාපේක්ෂතාවාදියකු මිස බෞද්ධයකු නො වේ. උදයසිරි වික්‍රමරත්න මහතා ඥාන විභාගයක් වූ නිර්මාණාත්මක සාපේක්ෂතාවාදය පිළිබඳ ව අබමල් රේණුවක්වත් නොදන්නා බව ඒ කියමනෙන් ම පැහැදිලි වන බව අපි කීවෙමු. මගේ බෞද්ධකම හෝ අබෞද්ධකම හෝ පැත්තකින් තබමු. එහෙත් කපිල පීරිස් මහතා හොඳ බෞදධයෙක් වෙති. එසේ වුවත් ඔහු තම මතවාද අත්හැරීමට අකමැති වෙයි. තම මතවාදවල ම එල්බ ගෙන සිටියි. තමන්ට තර්ක නොමැති වුවත් තම මතවාද අත්හැරීමට අකමැති මොහු තම කුහක ප්‍රතිපත්තිය දනුව තර්කයෙන් යමක් දැනගැනීමට නොහැකි යැයි කීම ඉඩ ඇත. එහෙත් එසේ කිවහොත් ඉන් ප්‍රතික්ෂෙප වන්නේ බෞද්ධ සංස්කෘතිය අනුව වුවත් දැනුම ලබාගැනීමේ (නිර්මාණය කිරීමේ) එක් ක්‍රමයක් වූ අනුමානය ය.

අනුමානයෙන් දැනුම නිර්මාණය කිරීම මේ බෞද්ධයනට  අනුව අකැප යැයි කියමු. එසේ නම් ඔවුන්ට ප්‍රත්‍යක්ෂයෙන් අවබෝධ වූ දැනුමක් ඊනියා අපේ ඉංජිනේරු සම්ප්‍රදාය සම්බන්ධයෙන් ඇත් ද? නිව්ටෝනීය විද්‍යාවෙන් ඔවුන් මෙතෙක් ලබාගෙන ඇති ඊනියා අපේ ඉංජිනේරු සම්ප්‍රදාය සම්බන්ධ දැනුම කුමක් ද? කපිල පීරිස් මහතා කරන්නේ අපේ පැරණි නිර්මාණ නිව්ටෝනීය විද්‍යාවෙන් පැහැදිලි කිරීම මිස වෙනත් විශ්වකර්ම වැඩක් නො වේ. ඔහු අපේ ඉංජිනේරු සම්ප්‍රදායක මූල ධර්ම කිහිපයක්වත් නිව්ටන්ගේ පිහිටෙන් ලබාගෙන ඇත් ද? අපේ ඉංජිනේරු විද්‍යාවක මූල ධර්ම කිහිපයක්වත් නැතිවන්නට හේතුවක් නැත. අපේ වෙදකමෙහි ගොවිකමෙහි හා වෙනත් දෑ හි මූලධර්ම ඇත. ඉංජදනේරු විද්‍යාවක පමණක් එසේ නොවීමට හේතුවක් නැත.

අප කලින් කියා ඇති පරිදි ඔහු කරන්නේ අපේ ජීවන සම්ප්‍රදාය ගැන කීම ය. ඒ වසාගැනීමට අපේ ඉංජිනේරු සම්ප්‍රදාය යන්නට පසුව සංවර්ධනය යන වචනය ද වරහන් තුළ ලියයි. අප විවාදයෙහි දී පෙන්වා දුන්නේ ඔහු එසේ සංවර්ධනය යන්න වරහන් තුළ ලිවීමට පටන්ගත්තේ ඔහු ඉංජිනේරු සම්ප්‍රදායක් ගැන කිසිම සඳහනක් නොකරන බව අප විසින් තේරුම් කරනු ලැබීමෙන් පසුව ය. අප කලින් ද කියා ඇති පරිදි සංවර්ධනය, ජීවන ක්‍රමය, වෙදකම, ඉංජිනේරු ශිල්පය පමණක් නොව ඇඳුම්, පැලඳුම්, සිරිත් විරිත් ආදිය ද එකිනෙකට බැඳී ඇත. එහෙත් වෙදකමට අදාළව වෙනම දැනුම් පද්ධතියක් ඇති සේ ම ඉංජිනේරු ශිල්පයට ද අදාළ වෙනුම් දැනුම් පද්ධතියක් වෙයි. සංවර්ධනය යන්න වරහන් තුළ ලියා තමන් ඉංජිනේරු සම්ප්‍රදායක් ගැන කතාකරන්නේ යැයි කීමට කපිල පීරිස් මහතාට නො හැකි ය.

කපිල පීරිස් මහතා තමාට විවාදයේ දී තර්ක නැතිවූ බව පිළිගැනීමට අකමැති ය. ඔහු පසුගිය 16 වැනි දා ලිපියෙන් ද විවාදය නැවත ආරම්භකිරීමට සූදනමක් ඇති බව කියයි. ඔහු දැන් යථාර්ථය වියුක්තකරණය ගැන වෙනත් අදහස් ප්‍රකාශ කරයි. ඉඩකඩ මදිවීම හේතුවෙන් ඔහු ලියා ඇති ඡෙද කිහිපය උපුටා දක්වා එහි වැරදි පෙන්වා දීම මේ ලිපියෙන් කළ නො හැකි ය. එබැවින් ඒ පිළිබඳ කරුණු දැක්වීම මීළග සතියට කල්දැමීමට සිදුවෙයි. ඔහුගේ අදහස් ඔහුගේ වචනවලින් ම දක්වා එහි දොස් පෙන්වීම වඩා සුදුසු ප්‍රතිපත්තිය යැයි සිතමි.

එහෙත් එයට පළමුව කිවයුතු කරුණු දෙකක් වෙයි. පළමුව කපිල පීරිස් මහතා යම් මතයක එල්බ ගෙන ඒ සනාථ කිරීමට තර්ක සොයන බව පැහැදිලි ය. තමා ඉදිරිපත් කරන තර්ක වැරදි යැයි පෙන්වූ විට ඔහු තම මතය ම පුන පුනා කියයි. නැතහොත් තවත් වැරදි තර්කයක් ඉදිරිපත් කරයි. කපිල පීරිස් මහතා නිව්ටන්ගේ නියම, යථාර්ථය හා වියුක්තය පිළිබඳ අලුතෙන් වැරදි තර්ක ඉදිරිපත් කරන්නේ එම මතය අත්හැරීමට ඔහු සූදානම් නැති බැවිනි. විවාදය නිමවීමෙන් පසුව මා ඒ විවාදයට අදාළ කිසිවක් පසුගිය සති දෙක තුනේ මා ලියූ ලිපිවල සඳහන් නොකිරීමට වග බලාගත්තෙමි. එහෙත් කපිල පීරිස් මහතා තම ඊනියා අපේ ඉංජිනේරු සම්ප්‍රදායේ ලිපි මගින් නැවතත් විවාදය ආරම්භ

© Prof. Nalin De Silva

කිරීමට සූදානමින් සිටියි. ඒ ගැන මට කිසිදු ගැටළුවක් නැත. කපිල පීරිස් මහතා විද්‍යාවන්හි (බටහිර හා වෙනත්) ඉතිහාසය හා දර්ශනය නොදැන ඉදිරිපත් කරන තර්කවලට පිළිතුරු දීම ඉතාමත් පහසු කාර්යයකි. එහෙත් එමගින් අපේ ප්‍රවාද ලිපි පෙළ අඛණ්ඩ ව ලිවීමට නොලැබෙන බව පාඨකයනට තේරුම් යා යුතු ය.

කපිල පීරිස් මහතා නිව්ටන් ඊනියා යථාර්ථයෙන් හා වියුක්තයෙන් මුදවාගැනීමක් ගැන කතාකළත් ඔහුට ඒ කළ නොහැකි බව අපි විවාදයේ දී පෙන්වා දුන්නෙමු. ඔහු දැන් විද්‍යාවේ (බටහිර හා වෙනත්) ඉතිහාසයක් ගැන සඳහන් කරමින් කරන උපකල්පනවල කිසිදු වැදගත්කමක් නැත. ඔහුට අවශ්‍ය කිසියම් තර්කයකින් නිව්ටන්ගේ නියම ඊනියා අපේ ඉංජිනේරු සම්ප්‍රදාය දැනගැනීමට (එය එසේ දැනගත නොහැකි ය) යොදාගත යුතු බව කීම ය. එමගින් ඔහු අවසානයේ දී කරන්නේ පාසල් සිසුන් හා වෙනත් අය නිව්ටන්ගේ ආධිපත්‍යයට යටකිරීම පමණකි.

අප සූදානම් වන්නේ අපේ විද්‍යාවක් ගොඩ නැගීමට ය. එහි දී අපට වත්මන් ශිෂ්‍ය පරම්පරාව නිව්ටන්ගේ, එනම් බටහිර ආධිපත්‍යයෙන් ගලවා ගැනීමට අවශ්‍ය වෙයි. කපිල පීරිස් මහතා කරන්නේ එහි විරුද්ධ පැත්ත ය. ඔහු උපායශීලීව ශිෂ්‍යයන් නිව්ටන්ගේ ආධිපත්‍යයට යට කරන්නේ නිව්ටන් වියුක්තයෙන් හා යථාර්ථයෙන් මුදාගත හැකි ය යන මිථ්‍යාව සිසුන් තුළ ඇති කිරීමෙනි. බටහිර විද්‍යාව අපේ සංස්කෘතියට අවශෝෂණය කිරීම අපට ගැටලුවක් නො වේ. දැනුම නිර්මාණය කිරීමේ එක් ක්‍රමයක් ලෙස මගේ ලෝකය කෘතියෙහි අවශෝෂණය ද සඳහන් වෙයි. එහෙත් කපිල පීරිස් මහතා කරනානේ අවශෝෂණයක් නො වේ. කපිල පීරිස් මහතා විවාදය නැවතත් ආරම්භ කර ඇත. අපට නැවතත් ඔහු හෙළිදරව් කිරීමට සිදුවේ. ඒ සඳහා පුවත්පතේ ඉඩ ලබාගැනීම පිළිබඳ ව පාඨකයන්ගෙන් හා කතෘතුමාගෙන් සමාව අයදිමි. කපිල පීරිස් මහතා කැමති නම් පුවත්පත ඒ සඳහා යොදා නොගෙන අපට මේ කරුණු සම්බන්ධයෙන් ප්‍රසිද්ධ විවාදයක් පැවැත්විය හැකි ය. ඒ විවාදය කපිල පීරිස් මහතා සේවය කරන නරඹි ආයතනයේ වුව ද පැවැත්වීමට මම කැමැත්තෙමි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva